# ප්‍රවෘත්ති නිවේදනය
# PRESS RELEASE

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு அத்துடன் பெண்கள் மற்றும் சிறுவர் மற்றும் சமூக பாதுகாப்பு

Ministry of Women & Child Affairs, Social Security, Health & Indigenous Medicine Services

Telephone office: 2693919 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540


**2020.03.15**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී /ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

**කොරෝනා වෛරස් තත්ත්වය මැඩපැවැත්වීම සඳහා හිඟයකින් තොරව ඖෂධ, ආරක්ෂිත මෙවලම් සහ වෛද්‍ය උපකරණ තොග තබාගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් පියවර.**

ශ්‍රී ලංකාව තුළ කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම, පාලනය සහ ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ, ආරක්ෂිත මෙවලම් සහ වෛද්‍ය උපකරණ තොග ප්‍රමාණයන් හිඟයකින් තොරව තබාගැනීමේ වැඩපිළිවෙල සොයා බැලීම සඳහා සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් විශේෂ සාකච්ඡාවක් පසුගියදා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පැවැත්විනි.

වෛද්‍ය සැපයුම් අංශයේ නිලධාරීන්, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ නිලධාරීන් සහ රෝහල් අධ්‍යක්ෂවරුන් මෙම සාකච්ඡාවට සහභාගි විය.

විශේෂයෙන්ම මෙහිදී කොරෝනා වෛරස් රෝගය වැළැක්වීම, පාලනය සහ ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ සහ වෛද්‍යවරු ඇතුලු සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය ආරක්ෂිත වෛද්‍ය උපකරණ, මුඛ ආවරණ, අත් ආවරණ තොග වශයෙන් තබාගැනීම පිළිබඳව සාකච්ඡා කරන ලදි.

ඉහත කටයුතු සඳහා රාජ්‍ය ඖෂධ සංස්ථාවට සහ වෛද්‍ය සැපයීම් අංශයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන කඩිනමින් ලබාදීමටත්, හදිසි මිලදී ගැනීම් සඳහා අවශ්‍ය අවසරය ලබාදීමටත් තීරණය කරන ලදි. ඒ අනුව ඉදිරි දින 02 තුල එම මිලදී ගැනීම් සිදු කොට අවශ්‍යතාවය අනුව ඖෂධ, ආරක්ෂිත මෙවලම් සහ වෛද්‍ය උපකරණ රෝහල්වලට බෙදාහැරීමට කටයුතු කරන උපදෙස් ලබාදුන් සෞඛ්‍ය අමාත්‍යතුමිය රෝහල් වලට බෙදාහැරීමෙන් පසු ද අඛණ්ඩව පසුවිපරම් කටයුතු සිදු කරන ලෙස ද නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදි.

මෙම අවස්ථාවට සෞඛ්‍ය ලේකම් භද්‍රානි ජයවර්ධන මහත්මිය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ සභාපති වෛද්‍ය ප්‍රසන්න ගුණසේන මහතා, රෝහල් අධ්‍යක්ෂවරු ඇතුලු අමාත්‍යාංශයේ නිලධාරින් පිරිසක් එක්ව සිටියහ.


විරාජ් අබේසිංහ
(මාධ්‍ය ලේකම්)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය


